# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/11 - 2016 අගෝස්තු මස 30 වැනි අඟහරුවාදා - 2016.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ පිලැස්ස භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/3/1226.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 699-මඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලැස්ස ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ගුණතිලක මහතා විසින් මැන සකස් කරන ලද අංක 2160 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 121 හා 122 වශයෙන් දැක්වෙන ''ඩේසි මවුන්ට් වත්ත'' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 32 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

01. කැබලි අංක - 121<br>
ඉඩමේ නම : ඩේසි මවුන්ට් වත්ත<br>
ප්‍රමාණය : පර්චස් 16

මායිම් :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 2160 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 122 ; |
| *නැගෙනහිරට* | : | එම සැලැස්මේ කැබලි අංක 124 B ; |
| *දකුණට* | : | එම සැලැස්මේ කැබලි අංක 120 ; |
| *බටහිරට* | : | පීලිකඩ වත්ත. |

1A - G 24144 — 27 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. එච්. පී. සුනිල් වික්‍රමරත්න මහතා,
අංක 13, බෙට්ටියගොඩ,
කහපත්වල.

02. කැබලි අංක : 122
ඉඩමේ නම : ඩේසි මවුන්ට් වත්ත
ප්‍රමාණය : පර්චස් 16

මායිම් :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 2160 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 123 ; |
| *නැගෙනහිරට* | : | එම සැලැස්මේ කැබලි අංක 124B ; |
| *දකුණට* | : | එම සැලැස්මේ කැබලි අංක 121 ; |
| *බටහිරට* | : | පීලිකඩ වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. පී. ඩබ්ලිව්. ඒ. අනුර රංජිත් මහතා,
බෙට්ටියගොඩ,
කහපත්වල,
කුඹුරේගම.

09 - 580

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බදුල්ල නාගරික අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතියේ පොම්පාගාර අංක 10 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1217.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර ගමේ පිහිටි ගඟබඩ පාර ඔයවේලෝන නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | බදුලුඔය ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | ගඟබඩ පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. එස්. කරොලිනා පෙරේරා මහත්මිය,
(ලිපිනය නොදනී)

09 - 581

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බෙලිඅත්ත - කුඩාහීල්ල ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමය යටතේ ජල මූලාශ්‍රය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1214.

*උපලේඛනය*

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 368, කුඩාහීල්ල - උතුර ග්‍රාම නිලධාරී වසමේ අම්බල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්. එච්. එම්. කේ. කරුණාරත්න මහතා විසින් සකස් කරන ලද අංක 0567 පිඹුරේ කැබැලි අංක 1 ලෙස දක්වෙන රුක්අත්තනහේන නමැති ඉඩමෙන් හෙක්ටයාර් 0.0136 (පර්චස් 5.4) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ः

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රධාන මාර්ගය දක්වා වූ ප්‍රවේශ මාර්ගය හා කැබලි අංක 2B හි ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 2B හි ඉතිරි කොටස ; |
| *දකුණට* | : | කැබලි අංක 2B හි ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | කැබලි අංක 2B හි ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ආර්. එම්. ජයසිංහ මිය,
අංක 403/1,
මාදුරුප්ප පාර,
අම්බලන්තොට.

09 - 582

---

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක : 1972/48 හා 2016.06.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ අංක 2A පිටුවේ ප්‍රකාශයට පත් කරන ලද නියමයේ උප ලේඛනයේ අත්කර ගත යුතු ඉඩමේ ප්‍රමාණය පර්චස් 103 ක් වශයෙන් සඳහන් වුවත් එය පර්චස් 5 ක් වශයෙන් විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1208.

09 - 583

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.